**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 2 ව්‍යාපෘතිය - 2019**

**-----------------------------------------------------------------------------------------------------------**

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3030-එස්ආර්අයි(එස් එෆ්) දරන ණය ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම් වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතිය සංරචක 8 යටතේ ක්‍රියාත්මක වේ. (i) කොළඹ නගරයේ දකුණු කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව (ii) කොළඹ නගරයේ බටහිර කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහාවූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව (iii) මහරගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ඉහළ මහල 02 ඉදිකිරීම (iv) පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සඳහා කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම (v) මධ්‍යම පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම (vi) එළිහවුස් ජලාශ පරිශ්‍රයේ යෝජිත පොම්පාගාරයේ සිවිල් වැඩ (vii) එළිහවුස් ජලාශ පරිශ්‍රයේ යෝජිත පොම්පාගාරයේ යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික් වැඩ හා (viii) කොළඹ නගරය සඳහා උපදේශනය සහ සහභාගීත්ව ක්‍රියාකාරකම් සමඟ ප්‍රජාවන්ගේ ධාරිතා වර්ධනය. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එජඩො මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 හෝ සියයට 59.3 කට සමාන එජඩො මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 හෝ සියයට 15.3 කට සමාන එජඩො මිලියන 18 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යායනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 හෝ සියයට 25.4 කට සමාන එජඩො මිලියන 30 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. තවද, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එජඩො මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එජඩො මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් 2022 ඔක්තෝම්බර් 15 දක්වා ව්‍යාපෘති කටයුතු කිරීමට කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට වැඩසටහන ව්‍යාපෘති 02 හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

වැඩසටහන වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
-

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවෙහි නිරූපණය වන සෘජු ගෙවුම් ශේෂය සහ ප්‍රතිපූර්ණය කිරීම් සහ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කරන ශේෂය අතර රු.මිලියන 6.44 ක වෙනසක් නිරීක්ෂණය විය. | 6.44 | මූල්‍ය ප්‍රකාශනයන්හි වියපැහැදම් වැඩියෙන් දැක්වීම | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙහි වාර්තාව (814 වාර්තාවේ) මත පදනම්ව ව්‍යාපෘතියෙහි සෘජු ගෙවීම් යාවත්කාලීන කරනු ලැබේ. කෙසේ වෙතත් විශේෂයෙන් වර්ෂ අවසානයේ වාර්තාව යාවත්කාලීන කිරීමේ සැලකිය යුතු කාල පරතරයක් ඇත. මෙම වර්ෂයේදී 814 වාර්තාව 2020 පෙබරවාරි මස අගදී පමණක් ලබාගත හැකි විය. මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීම සඳහා එවැනි කාලයක් බලාසිටීමට නොහැකි නිසා, වර්ෂය අවසානයේ විනිමය අනුපාත පදනම් කරගෙන වසර අවසානයේ ඩොලර් ගනුදෙනු යාවත්කාලීන කරන ලදී. ඊළඟ වර්ෂයේදී 814 වාර්තාවේ තත්‍ය වටිනාකම පදනම් කරගෙන විනිමය අනුපාතය විචලනය නිසා අඩු හා වැඩි ගැලපීම් ගිණුම් වලට ගනු ලැබේ. මෙම වෙනස විගණකවරු හඳුනාගෙන ඇත්තේ එම හේතු නිසාය.<br>අනෙක් අතට ඊආර්ඩී විසින් 814 වාර්තාව කඩිනමින් නිකුත් නොකරන විට ව්‍යාපෘතියට මෙවැනි ගැලපීම් වළක්වා ගත නොහැක. | ණය කළමනාකරණ පද්ධති (ඩී.ආර්.එම්.එස්) වාර්තාව සමඟ සැසඳීම කළයුතු වේ. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරන වැඩසටහනෙහි ව්‍යාපෘති 2 හි ණය මුදලින් එකතුව වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 2.31 ට සමාන | 376.74 | ණය මුදල්, ණය පොළී සහ බැඳීම් ගාස්තු අඩුවෙන් දැක්වීම | අතිරේක සාමාන්‍යාධිකාරී මූල්‍ය උපදෙස් අනුව ව්‍යාපෘතිය සඳහා පොළී හා බැඳීම් ගාස්තු ගිණුම් ගත කරනු නොලැබේ. (දැනටමත් කෙටුම්පත් විගණන වාර්තාව සමඟ පිළිතුරු සපයා ඇත.) කෙසේ වෙතත්, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සඳහා සටහන්හි සටහන් අංක 17 යටතේ පොළී සහ බැඳීම් ගාස්තු අනාවරණය කර ඇත. | අදාල වියදම් වෙන්කර ඒ අනුව ගිණුම් ගත කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.මිලියන 376.74 ක පොළී සහ බැඳීම් ගාස්තු අයකර ඇත. කෙසේ වෙතත් එය සමාලෝචිත කාලපරිච්ඡේදයේදී ක්‍රියාත්මක කරන ආයතනත් අතර වෙන වෙනම වෙන්කර මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ණය මුදල එම ප්‍රමානයෙන් අඩුවෙන් දැක්වේ. | | | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද අන්තර් ගෙවීම් සහතිකපත් වලින් අයකර තිබූ වැඩ පූර්ව අත්තිකාරම් වටිනාකම වූ රු.මිලියන 30.26 ක් සහ රඳවාගැනීම් මුදල් වටිනාකම වූ රු.මිලියන 23.92 මූල්‍ය ප්‍රකාශන වල නිරූපණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියෙහි කෙරීගෙන යන වැඩ ඊට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | 54.18 | කෙරීගෙන යන වැඩ අඩුවෙන් දැක්වීම. | කොන්ත්‍රාත්කරු සඳහා ගෙවිය යුතු මෙම වටිනාකම වර්ෂය අවසානයේ ගිණුම සඳහා අදාල වේ. විගණකගේ නිර්දේශ පදනම්ව වසර අවසානයේදී ගෙවිය යුතු වන විට පූර්ව අත්තිකාරම් හා රඳවාගැනීමේ වටිනාකම හඳුනාගෙන අනාගතයේදී ගිණුම් ගත කරනු ලැබේ. | ඌණතාවය නිවැරදි කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. |
| (ඈ) | ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයන් වෙත මාරුකරන ලද රු.මිලියන 4.52 ක් වටිනා පරිගණක 20 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මාරුකරන ලද ගිණුම | 4.52 | කෙරීගෙන යන වැඩ වැඩියෙන් දැක්වීම සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන | අදාල ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන අයිතමයන් ප්‍රාග්ධනිත කර නොමැති නිසා ව්‍යාපෘතිය විසින් මෙම අගයන් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා ඇත. 2020 දී ප්‍රාග්ධනිත කිරීම අවසන් කිරීමට අදාල ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයන් සමඟ සම්බන්ධීකරණය කරනු ලැබේ. | ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| යටතේ පෙන්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි. | මණ්ඩලයට මාරුකරන ලද වත්කම් අඩුවෙන් දැක්වීම. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හි භෞතික ප්‍රගතිය

| අයිතම අංකය | ක්‍රියාකාරකම් | ඒකක | අපේක්ෂිත ප්‍රගතිය | 2019 දෙසැම්බර් 31 දිනට ළඟාකරගත් ඉලක්කයන් | බලපෑම | කළමනාකරණ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ දකුණු කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම් සඳහා වූ පද්ධති පුනරුත්ථාපනය | | | | දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2019 ජූනි 30 සිට 2022 ඔක්තෝම්බර් 15 දක්වා දීර්ඝ කර තිබුණි. | වාර්තාවේ සඳහන් වී ඇති පරිදි 2019 දෙසැම්බර් 31 දක්වා ලබා ඇති ප්‍රගතිය ව්‍යාපෘතිය සැලසුම් කල කාල සීමාව තුල නිම කිරීමට ප්‍රමාණවත් නොවේ. යම්තාක් දුරට පාස්කු ඉරිදා ප්‍රහාරය සහ දේශගුණික විපර්යාසයන් යන සීමාවන් ඉහත සඳහන් මට්ටමේ ප්‍රගතියට හේතු වී තිබේ. 2020 වර්ෂයේ සිට ප්‍රගතිය වැඩි කිරීමට නියමිතව තිබුණද COVID-19 වසංගතය හේතුවෙන් වැඩ කටයුතු සීමා කර තිබුණි. එබැවින් සියළු ප්‍රමාදයන් සැලකිල්ලට ගනිමින් භෞතික ප්‍රගතිය සතුටුදායක මට්ටමකට ඉහළ නැංවිම සඳහා සංශෝධිත වැඩසටහනක් ඉදිරිපත් කරන ලදී. තවද වඩා හොඳ වැඩ කිරීමේ හා යන්ත්‍රෝපකරණ සහිත | ඉදිකිරීම් කටයුතු හා ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පිලියම් යෙදී යුතු අතර ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන රේඛීය අමාත්‍යාංශය සහ ක්‍රියාත්මක කරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| | - නළ එළීම | මීටර් | 212,758 | 80,198 | | | |
| | - සම්බන්ධතා මාරු කිරීම් | නිවාස ඒකක | 33,337 | 7,200 | | | |
| | - දිස්ත්‍රික්ක මැනුම් ප්‍රදේශ ප්‍රගතිය | සංඛ්‍යාව | 23 | _ | | | |
| | - සමස්ත කොන්ත්‍රාත් ප්‍රගතිය | ප්‍රතිශතය | 78 | 42 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | මිනිස් බලයක් වැඩිකරමින් පවතී. ඊට අමතරව, ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා ශ්‍රමිකයන්ගේ ඵලදායිතාව සහ වැඩකිරීමේ හැකියාව වැඩි කිරීම සඳහා පුහුණු වැඩසටහන් අඛණ්ඩව සිදු කරනු ලබයි. අනපේක්ෂිත භෞතික තත්වයන් හේතුවෙන් ඇතිවන දුෂ්කරතා සලකා බැලීමෙන් වාර්තාවේ සඳහන් පරිදි ව්‍යාපෘති කාල සීමව දීර්ඝ කල හැකිය. | |
| (ආ) | කොළඹ නගරයේ බටහිර කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම් සඳහා වූ පද්ධති පුනරුත්ථාපනය | | | | දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2019 ජූනි 30 සිට 2022 ඔක්තෝම්බර් 15 දක්වා තිබුණි. | අපේක්ෂිත ඉලක්කය හා ප්‍රගතිය සංසන්දනයේදී පිටුපසින් සිටින හෙයින් වාර්තාවේ දක්වා ඇති පරිදි ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ වීමේ හැකියාවක් ඇත. සම්පත් වැඩිකිරීම මඟින් ප්‍රගතිය වැඩිකිරීමට සහ මුල් කොන්ත්‍රාත් කාලයට ව්‍යාපෘතිය නිමකිරීමට අවශ්‍ය උත්සහයන් ගනිමින් සිටී. | ඉදිකිරීම් කටයුතු හා ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පිලියම් යෙදී යුතු අතර ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන රේඛීය අමාත්‍යාංශය සහ ක්‍රියාත්මක කරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය. |
| | නළ එළීම | මීටර් | 106,467 | 67,364 | | | |
| | සම්බන්ධතා මාරුකිරීම් | නිවාස ඒකක | 9,593 | 4,652 | | | |
| | දිස්ත්‍රික්ක මැනුම් ප්‍රදේශ ප්‍රගතිය | සංඛ්‍යාව | 18 | 01 | | | |
| | සමස්ථ කොන්ත්‍රාත් ප්‍රගතිය | ප්‍රතිශතය | 85 | 48 | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | පාමංකඩ කලාප ඉංජිනේරු කාර්යාලය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකරීම | | ඉදිකිරීම සඳහා ඉඩමක් නොමැතිවීම නිසා ඉදිකිරීම ආරම්භ කර නොමැත. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී ව්‍යාපෘති අරමුණු ළඟාකර ගැනීමට නොහැකි වේ. | ආරම්භක අදියරයේදී කොළඹ දකුණ (පාමන්කඩ) කලාප ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම සඳහා නාවල නාරාහේන්පිට පාරේ පිහිටි පර්චස් 40 ක ඉඩමක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත බදුදීමට නාගරික සංවර්ධන අධිකාරිය එකඟ වී තිබේ. පසුකාලීනව කොළඹ මහ නගර සභාව විසින් භූගෝලීය යෝග්‍යතාව හේතුවෙන් මලාපවහන පොම්පාගාරය ඉදිකිරීම සඳහා එකී ඉඩම ඉල්ලා තිබුණි. ආර්ථික කළමනාකරණය පිළිබඳ නිල කමිටු (ඕ.සී.ඊ.ම්) රැස්වීම්වල සාකච්ඡා මාලාවකින් අනතුරුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම ඉඩම කොළඹ මහනගර සභාවට වෙන්කිරීමට තීරණය කර ඇති අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ඒ හා සමාන ඉඩමක් විකල්ප ස්ථානයක (කිරිමණ්ඩල මාවතෙහි මිල්කෝ පරිශ්‍රය) වෙන්කර තිබේ. වර්තමානයේදී යූඩීඒ විසින් ලේඛණ ක්‍රියාවලිය සිදුකිරීම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අධිකාරිය පවරා ඇත. ඒ අනුව, එම ඉඩම 2020 අගෝස්තු 2 වන සතියේ සමීක්ෂණය සිදුකිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබේ. ඉහත මන්දගාමී ක්‍රියාවලිය පාමන්කඩ කලාපීය | ඉඩම පවරාගැනීමට පියවර ගත යුතු අතර තවදුරටත් ප්‍රමාදයකින් තොරව වැඩ ආරම්භ කලයුතුය. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ඉංජිනේරු කාර්යාලයේ සැලසුම් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීමට හේතුවී ඇත. | |
| (ඉ) | යෝජිත පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාර ගොඩනැගිල්ල සහ ආපනශාලාව ඉදිකිරීම | ප්‍රතිශතය | 90 | 69 | | ව්‍යාපෘති කාල සීමාව සමඟ ව්‍යාපෘතියේ අරමුණු ළඟාකරගත නොහැකි වීම. | එකතු කල හේතු නිසා ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීමට අවශ්‍ය වේ.<br>• අනපේක්ෂිත භූගත තත්වය සහ මිලිමීටර් ϕ900 බෝර්ඩ් කොන්ක්‍රීට් පයිල් සංඛ්‍යාව 13 සිට 17 දක්වා වැඩි වීම වැනි අදාල සැලසුම් වෙනස් කිරීම්<br>• පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු කම්කරුවන් වැඩ පරිශ්‍රයට පැමිනීම දුර්වල වීම නිසා එහි ප්‍රගතිය මන්දගාමී විය.<br>• ජලයෙන් යටවීම වැනි අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන්<br>• දේශීය සංරචකය යටතේ වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම ප්‍රමාද වීම සහ අයිපීජ්- 11 දක්වා වැට් බදු නොගෙවීම<br>• කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන්<br>• ව්‍යාපෘති පරිශ්‍රයට ශ්‍රම බලකාය යෙදවීම සීමා වීම (සෞඛ්‍ය මාර්ගොපදේශය )<br>• යාන්ත්‍රික හා විදුලි අයිතම නිෂ්පාදනය ප්‍රමාදවීම | සැලසුම් කල වැඩ සැලැස්ම තුල වැඩ නිම කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

(විදේශීය)

- යාන්ත්‍රික හා විදුලි ආනයනය කිරීම අඩාල වීම.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 ඔක්තෝම්බර් මාසයේදී ප්‍රදානය කරන ලද කොළඹ නගරයේ බටහිර කොටසේ ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවෙහි මීටර් 106,467 ක නල එලීම සහ දිස්ත්‍රික් මැනුම් ප්‍රදේශ 18 ක නිවාස 9,593 ක සේවා සම්බන්ධතා මාරුකිරීම සැපයීම නිම කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට මීටර් 67,364 ක පමණක් නල එලීමේ වැඩ නිම කර තිබූ අතර නිවාස ඒකක 4,652 ක සේවා සම්බන්ධතා මාරු කිරීම් සපයා තිබුණි. තවද, එක් දිස්ත්‍රික් මීටර් මැනුම් ප්‍රදේශයක මීටර් 1,117 ක නළ එළීම් කටයුතු 2020 මාර්තු 31 දින දක්වා ආරම්භ කර නොතිබුණි. ප්‍රධාන අරමුණ වූයේ ජල සැපයුම් පද්ධතිය පුනරුත්ථාපනය හා පුළුල් කිරීම සහ කොළඹ නගරයේ ආදායම් නොලබන ජල පරිමාව අඩු කිරීමයි. කෙසේ වෙතත්, දිස්ත්‍රික්ක මැනුම් ප්‍රදේශ 18 න් එක් දිස්ත්‍රික්ක මැනුම් ප්‍රදේශයක් පමණක් සැලසුම්කල ව්‍යාපෘති කාලසීමාව තුලදී සම්පූර්ණයෙන් නිමකර ආදායම් නොලබන ජලය | ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කිරීමේ හැකියාව | • මීටර 106,467 ක නල එලීම් නිමකිරීමට සැලසුම්කිරීම සහ දිස්ත්‍රික්ක මැනුම් ප්‍රදේශ 18 ක නිවාස 9,593 කට සේවා සම්බන්ධතා සැපයීම් හා එකඟ වේ.<br>• 2019 දෙසැම්බර් 31 දක්වා මුළු දිග මීටර් 67,364 ක් සහ සේවා සම්බන්ධතා 4,652 ක් සම්පූර්ණ කර ඇත.<br>• සැලසුම් හා සසඳන විට ප්‍රගතිය නිශ්චිත ප්‍රමාණයකට අඩුය. අපි මුහුණදුන් ප්‍රධාන බාධක වනුයේ අනපේක්ෂිත භූගත තත්ත්වයන් නල එලීමට මන්දගාමී වීම අහිතකර කාළගුණ තත්ත්වය අදාල අධිකාරීන්ගෙන් අනුමැතීන් ලබාගැනීමට දුෂ්කරවීම යනාදියයි. තවද පාස්කු ප්‍රහාරය හේතුවෙන් 2019 දී පැනවූ ඇඳිරි නීතිය ඉදිකිරීම් කටයුතු සඳහා අහිතකර ලෙස බලපා තිබුණි. | සැලසුම් කල කොන්ත්‍රාත් කාල සීමාව තුල වැඩ කඩිනමින් කිරීමට ඉක්මන් පියවරයන් ගත යුතු අතර ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය මඟින් කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | අඩු කිරීමට සම්බන්ධ කරගෙන ඇත. | | • 2020 මාර්තු 31 දිනට ඩී එම් ඒ ඒකක මීටර් 1,117 ක නල එලීම් වැඩ ආරම්භ කර නොතිබීම හා එකඟ වේ. නියමිත කාලසීමාව තුලදී කොළඹ නගර සභා ජලාපවහන නිෂ්කාෂණයට හා කැණීම් අනුමත කිරීමට  අනුමැතීන් ඉල්ලා තිබූ අතර අනුමැතීන් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, 2020 ජූලි 14 දින වන විට ඩී එම් ඒ 22 හි කොටසක් සඳහා ජලාපවහන නිෂ්කාෂණයට සීඑම්සී අනුමැතිය ලැබී ඇති අතර වර්තමානයේදී නගරසභාවෙන් කැණීම් කටයුතු සඳහා අනුමැතිය ඉල්ලා ඇත. අනුමැතිය ලැබූ විගසම නල එලීම් කටයුතු ආරම්භ කෙරේ. ඩී එම් ඒ 18 න් ඩී එම් ඒ එකක් පමණක් සම්පූර්ණයෙන් නිමකර ඇති බව හා අපි එකඟ වෙමු. කෙසේ වෙතත්, අපි බොහෝ ඩී එම් ඒ හි නව නළ එලීම් කර නල ක්‍රියාත්මක කිරීම් කර ඇත. තවද විසන්දි කිරීම් කොටසක් අවසන් කර ඇති අතර ඉතිරිය ක්‍රියාත්මක වෙමින් පවතී. එම නිසා අනෙකුත් ඩී එම් ඒ බොහෝමයක් ව්‍යාපෘති ක්ෂේත්‍රය තුල ආදායම් නොලබන ජලය අඩු කිරීමට වර්තමානයේදී දායක වේ. | |
| (ආ) | 2021 ජූනි මාසය වන විට කොළඹ නගරයේ දකුණු කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව යටතේ මීටර් 212,758 ක නල එලීම් කටයුතු සහ සේවා මාරුවීම් 33,337 ක් නිම කිරීමේ අපේක්ෂිත ඉලක්කයන් හා පිටුපසින් රැඳී අතර සහ 2019 දෙසැම්බර් 31 දිනට මීටර් 80,198 ක නල එලීම් | ව්‍යාපෘති කාල සීමාව දීර්ස වීමේ හැකියාව | ඉලක්කයන් සම්පූර්ණ කිරීමේදී සම්පූර්ණ කරන ලද සේවා සම්බන්ධතා සංඛ්‍යාව සතුටුදායක නොවේ. එබැවින් 2020 දී අනපේක්ෂිත ලෙස කොවිඩ් 19 පැතිරීමෙන් පසුව පුහුණු ශ්‍රමිකයන් හා යන්ත්‍රෝපකරණ වැඩි කිරීමෙන් නිවාස සම්බන්ධතා කටයුතු ආරම්භ කිරීමට පළමු ප්‍රමුඛතාවය ලබාදෙන ලදී. තවද, නව ඩී එම් ඒ වල නල එලීම් මෑතකදී ආරම්භ කර ඇති අතර | සැලසුම් කල කාල පරිච්ඡේදය තුල වැඩ කඩිනම් කිරීමට කඩිනම් පියවරයන් ගත යුතු අතර ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය |

| | | | | |
|---|---|---|---|---|
| | පමණක් සිදුකර ඇති අතර දිස්ත්‍රික් මැනුම් ප්‍රදේශ 23 ක නිවාස ඒකක 7,200 ක් සම්බන්ධතා මාරුකිරීම් අවසන් කර ඇත. තවද 2019 දෙසැම්බර් 31 දක්වා දිස්ත්‍රික් මැනුම් ප්‍රදේශ 06 ක මීටර් 48,026 ක නල එලීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | | මනා සම්බන්ධීකරණය, අවශ්‍ය මිනිස්බලය සහ යන්ත්‍රෝපකරණ වැඩිකිරීම සමඟ නල එලීමේ ප්‍රගතියක් දක්නට ලැබේ. ප්‍රගතිය වැඩි වී තිබුණත් ඉලක්ක ළඟාකරගැනීමෙන් කාර්යයේ ගුණාත්මකභාවය පවත්වාගැනීමටත් ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම රුකුලක් වේ. සභාපතිතුමා විසින්ද සම්පත් වැඩිකිරීමට දැනුම්දීමක් නිකුත් කරන ලදී. | කල යුතුය. |
| (ඇ) | 2018 නොවැම්බර් 12 වන දින රු.මිලියන 54.26 ක පිරිවැයකට භූගෝලීය තොරතුරු පද්ධති (ජී අයි එස් ) මෘදුකාංග සැපයීම සහ ස්ථාපනය කිරීම සහ වෙබ් යෙදවුම් හා පුහුණුව සංවර්ධනය සඳහා වූ කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර 2019 නොවැම්බර් 11 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි.<br>කෙසේ වෙතත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබූ අතර දත්ත ආකෘති සහ වෙබ් යෙදවුම් සැකසීම ප්‍රමාද වීම ප්‍රවේශවීමේ පහසුකම් ප්‍රධාන සර්වර් සමඟ වැඩ කිරීමට පුහුණුවීම්, ඇමතුම් මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධ කිරීම් සහ ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ වීමට ප්‍රධාන සර්වර් හි ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2020 ජූලි 31 දක්වා තුන්වතාවක් දීර්ඝ කර තිබුණි. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ ප්‍රමාදය. | වෙබ් ජී අයි එස් පද්ධතිය සංවර්ධනය කරන අතරතුර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කරන ලද කලාපීය නිළධාරීන්ගේ ක්ෂේත්‍ර සේවා යෙදවුම් සමඟ ඒකාබද්ධ කිරීම් කිහිපයක් සිදු කිරීමට සිදු වී ඇත. මේවන විට මෙම ක්ෂේත්‍ර සේවා යෙදවුම් සංවර්ධනය වෙමින් පවතින අතර ඒකාබද්ධ කිරීමේ කොටස එකවර සිදුකල යුතුය. සමහර අවස්ථාවන්හිදී, ක්ෂේත්‍ර සේවා යෙදවුම් සහ පාරිභෝගික පැමිණිලි කළමනාකරණය සංවර්ධනය කරන තුරු ජීඅයිඑස් කණ්ඩායමට බලා සිටීමට සිදුවේ. එබැවින් කොන්ත්‍රාත්තුවේ ආරම්භයේදී නොපැවතී මෙම නව අවශ්‍යතා නිසා දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දී තිබේ.<br>2019 දෙසැම්බර් මස අගවන විට ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය සතුව පැවති සියළු දත්ත කොන්ත්‍රාත්කරු වෙත භාර දෙන ලදී.<br>කොන්ත්‍රාත් පිරිවිතරයන්ට අනුව පවතින දත්ත නව සැලසුම් දත්ත ව්‍යුහය වෙත පරිවර්තනය පමණක් අවශ්‍ය වන අතර වැඩ අවසන් වේ.<br>තවද  කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් දින 60 ක ප්‍රමාදයක් සිදු වී ඇත. | වැඩ කඩිනම් කිරීම සඳහා පියවරයන් ගත යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදුන් කරුණු

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අත්තිකාරම් වශයෙන් රු.මිලියන 10 ක් ගෙවා ඇත. කෙසේ වෙතත්, වසර 4 ක් ගතවීමෙන් පසු වැට් බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, තක්සේරු ගාස්තු වටිනාකම් වූ පිළිවෙලින් රු.991,115 රු.178,897 හා රු.285,000 ක් අඩුකිරීමෙන් පසු රු.මිලියන 8.54ක මුදලක් ආපසු ලබාදී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම අත්පත්කරගැනීමේදී වැයකරන ලද රු.මිලියන 1.46 ක මුදල අනාර්ථික වියදමක් ලෙස සැලකේ. | ව්‍යාපෘති අරමුදල් අවුරුදු 3 ක් පුරා ඵලදායී නොවන වියදමක් බවට පත්වී ඇත | සම්පූර්ණ වටිනාකම පියවීමට ව්‍යාපෘතිය ඉල්ලීම කලද නාගරික සංවර්ධන අධිකාරිය වැට්, ජාතිය ගොඩනැගීමේ බද්ද හා තක්සේරු ගාස්තු අඩුකිරීමෙන් පසු ආපසු ගෙවන ලදී. | වැඩ ප්‍රමාදයකින් තොරව සිදුවන බව සහතික වීමෙන් පසුව අත්තිකාරම් ගෙවිය යුතුය. |
| (ආ) | තෙලවල යෝජිත පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාර ගොඩනැගිල්ල සහ ආපනශාලාවෙහි අන්තර් ගෙවීම් බිල්පත්‍ර අංක 18 ට අනුව, ප්‍රධාන කාර්යාලීය රැස්වීම් ශාලාව ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තුගත වටිනාකම වූ රු.මිලියන 11.91 න් රු.මිලියන 10.56 ක් කොන්ත්‍රාත් විෂය පථයට පටහැනිව විචලතා නියෝග (vo-09) යටතේ 2019 දෙසැම්බර් 31 දින ගෙවීම් කර තිබුණි. තවද ඉහත විචලතා නියෝගය අනුමත කර තිබුණේ 2020 ජූනි 04 දිනදීය. | ව්‍යාපෘති විෂය පථයට පටහැනිව සහ අතිරේක වැඩ යටතේ අනුමැතිය ලබා ගැනීමට පෙර ගෙවීම් කර තිබුණි . | පුහුණු මධ්‍යස්ථාන කොන්ත්‍රාත්තුවෙන් හඳුනාගත් ඉතිරිවීම් උපයෝගී කරගෙන සාමාන්‍යාධිකාරී (එන් ඩබ් එස් ඩී බී ) සහ අතිරේක සමාන්‍යාධිකාරී ( එන් ඩබ් එස් ඩී බී පී ඇන්ඩ් පී) විසින් කරන ලද විශේෂ ඉල්ලීම් ලිපිය ප්‍රකාරව (ඇමුණුම II) ප්‍රධාන කාර්යාලයේ (එන්ඩබ්ලිව්එස්ඩීබී) රැස්වීම් ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම ක්‍රියාත්මක කර ඇත. විචලතා නියෝගය 2020 ජූනි 04 දින අනුමත කර තිබුණත් විචලතා කමිටුව රැස්වී තිබුණේ 2020 පෙබරවාරි මාසයේදීය. (ඇමුණුම III) කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහ ගැටළු සහ ප්‍රමාද ගෙවීම සඳහා පොළී ගෙවීම වළක්වාගැනීම සඳහා සතුටුදායක ලෙස නිම කරන ලද වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට සාධාරණ ලෙස ගෙවා ඇත. | අතිරේක වැඩ සඳහා ගෙවීමට පෙර අනුමැතීන් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) 2019 දෙසැම්බර් 31 දිනට වටිනාකම වූ රු.මිලියන 112.44 ක අන්තර් ගෙවීම් බිල්පත් පියවීම ප්‍රමාද වීම මත අතිරේක මූල්‍ය ගාස්තු ලෙස රු.මිලියන 2.12 ක් ගෙවා තිබුණි. එබැවින් මෙවැනි වියදම් ඵලදායි නොවන වියදම් ලෙස සලකනු ලැබේ. | අනාර්ථික වියදමකි. | දේශීය අරමුදල් නොමැතිකම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ බිල්පත්වල දේශීය රජයේ කොටස පියවීම ප්‍රමාද වී ඇත. තවද ප්‍රමාණවත් නොවන විදේශ ප්‍රතිපාදන හේතුවෙන් භාණ්ඩාගාරය විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් සැකසීම තාවකාලිව නවතා දැමූ අවස්ථා තිබේ. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාද වී පියවා ඇති මෙම බිල්පත් සඳහා ප්‍රමාද පොළිය ඉල්ලීම් කර තිබූ අතර ව්‍යාපෘතියට අනාගතයේදී ද සැලකිය යුතු මුදලක් ප්‍රමාද පොළී ලෙස පියවිය යුතුවේ. | බිල් වටිනාකම් නියමිත දිනයන්ට පියවීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

### 3.4 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) තෙලවල පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාරය සහ ආපනශාලාව ඉදිකිරීම් සඳහා අන්තර් ගෙවීම් බිල්පත්‍ර අංක 18 යටතේ වූ 2019 නොවැම්බර් 30 දක්වා ගෙවීම් කරන ලද රු.මිලියන 26.61 ක අතිරේක වැඩ හා විචලතා නියෝග යටතේ ගෙවීම් කරන ලද රු.මිලියන 9.49 ක් වටිනා විචලතා නියෝග වැඩ සඳහා 2020 මැයි 31 දින දක්වා අනුමැතියක් ගෙන නොමැති විය. | කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා | 2019 නොවැම්බර් මාසයේදී අනුමැතිය අපේක්ෂිතව තිබියදී විචලාතා නියෝග සඳහා ගෙවීම් කර බව අපි පිළිගනිමු. කෙසේ වෙතත්, ගෙවනලද මුදල පීඅයියූ සහ උපදේශක විසින් සමාලෝචනය හා සහතික කරන ලදී. අපේක්ෂිත අනුමැතිය යටතේ ගෙවනු ලබන මුදල කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටින සත්‍ය මුදලට වඩා සැලකිය යුතු ලෙස අඩුය. 2019 නොවැම්බර් මසදී ඉහත විචලාතා නියෝග විචලාතා කමිටුව වෙත ඉදිරිපත් වුවත් කමිටුවේ සාමාජිකයින් විසින් සමහර අනුපාතයන් සලකා බැලීම නිසා එය අනුමත නොවීය. කෙසේ වෙතත්, දැනට අනුපාත එකඟ වී ඇති අතර අදාල විචලාතා නියෝග අවසන් කර ඉදිරිපත් කර ඊළඟ ක්ෂණික පැවැත්වෙන විචලාතා නියෝග කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කෙරේ. තවද අපේක්ෂිත විචලාතා ගෙවීම් අනාගතයේදී ආවරණ අනුමැතියකින් පමණක් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | විචලාතා නියෝග සඳහා ගෙවීම් කිරීමට පෙර නියමිත අනුමැතීන් ලබාගැනීමට ක්‍රියාපටිපාටියක් අනුගමනය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු රු.මිලියන 58.69 ක වටිනාකමකින් යුත් එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු 2019 දෙසැම්බර් 31 දින දක්වා පියවීමකින් තොරව දින 292 සිට දින 441 දක්වා කාලයක් පුරා හිඟව පවතී. | දුර්වල මූල්‍ය කළමනාකරණය | කොන්ත්‍රාත්කරුවන්ගේ දැනට අපේක්ෂිත වැට් බදු ගෙවීම වැය ශීර්ෂ පදනම මත ලබාගැනීමට අනුමැතිය සඳහා අඛණ්ඩව කටයුතු කරන අතර කොන්ත්‍රාත්කරුගේ ජාතියේ ගොඩනැගීමේ බදු පියවීම සඳහා යාන්ත්‍රනයක් සොයමින් පවතී. | නියමිත දිනට බිල්ගෙවීම් පියවීම සඳහා සුදුසු මූල්‍ය කළමනාකරණ යාන්ත්‍රනයක් සකස් කිරීම සඳහා පියවරයන් ගත යුතුයි. |
| (ඇ) | 2010 ජූලි 26 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 5 ට අනුව ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් විගණනය කර නොතිබුණි. තවද, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2018 ජූනි 10 වන දිනැති අංක 02/2006 චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට ව්‍යාපෘති කාර්යාලය පියවර ගෙන නොතිබුණි. | දුර්වල අභ්‍යන්තර පාලනය සහ චක්‍රලේඛ අවශ්‍යතාවලට අනුකූල නොවීම. | ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙහි අභ්‍යන්තර විගණන අංශය මඟින් මෙම කරුණු පැහැදිලි කරුණු ලැබේ. | චක්‍රලේඛ ප්‍රතිපාදන පිළිපැදිය යුතුය. |